# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## 1997 අංක 17 දරන බෙදුම් තඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1997 අගෝස්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 19.25 තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

# 1997 අංක 17 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 12 වන දින.]

එල්. ඩී.–ඕ. 66/95

## 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1997 අංක 17 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ යෙදෙන "කවර හෝ අයිතිකරුවකු විසින් නැතහොත් අයිතිකරුවන් වැඩි සංඛ්‍යාවක් විසින්" යන වචන වෙනුවට "කවර හෝ අයිතිකරුවකු විසින් හෝ අයිතිකරුවන් වැඩි සංඛ්‍යාවක් විසින්, ඔහුගේ හෝ ඔවුන්ගේ අයිතිය වෙනත් යම් තැනැත්තකුගේ ජීවිත බුත්තියට යටත්ව තිබුණ ද නොතිබුණ ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1977 අංක 21 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, එහි (1) වන වගන්තිය, ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) බෙදුම් නඩුවක් පැවරීමේ කාර්යය සඳහා අධිකරණය වෙත ඉදිරිපත් කරන සෑම පැමිණිල්ලකට ම, ඒ නඩුව අවසාන වශයෙන් විනිශ්චයක් කිරීමට ප්‍රථම පැමිණිලිකරු මියගියහොත් නඩුවේ කාර්ය සඳහා පැමිණිලිකරු ගේ නීත්‍යානුකූල නියෝජිතයා විය යුතු තැනැත්තකු, 81 වන වගන්තියට අනුකූලව නම් කරන ලද මේ පනතේ දෙවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූල වූ ලියවිල්ලක් අමුණා තිබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි යෙදෙන "පිටපත් දෙකකින්" යන වචන වෙනුවට "පිළිවෙලින්, "මුල් පිටපත"," දෙවන පිටපත", හා "තුන්වන පිටපත" යනුවෙන් සලකුණු කළ පිටපත් තුනකින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ඩී 042315—12,900 (96/11)

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"පැමිණිල්ල භාර ගනු ලැබූ විට අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

8. (1) බෙදුම් නඩුවක පැමිණිල්ල භාර ගනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින්, අප්‍රමාදව:—

(අ) ඒ නඩුව, ඇසීමට තිබෙන නඩුවක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ එක් එක් පිටපතෙහි, ඒ නඩුවට අධිකරණය විසින් දෙන ලද අංකය පිළිබඳ සඳහනක් ඇතුළත් කිරීමට සැලැස්විය යුතු ය;

(ආ) ඒ නඩුව, ඇසීමට තිබෙන නඩුවක් ලෙස ලියාපදිංචි කිරීමට ඇති එක් එක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත අප්‍රමාදව, කෙසේ වෙතත් පැමිණිල්ල භාරගත් දින සිට සති දෙකක් ඉකුත්වීමට පෙර, ඒ ඉල්ලුම් පත්‍රය පිටපත් තුනකින් යුක්තව යැවීමට සැලැස්විය යුතු ය;

(ඇ) ඇසීමට තිබෙන නඩුවක් ලෙස ලියාපදිංචි කිරීම ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ආපසු එවිය යුතු දිනය ලෙස, පැමිණිල්ල භාර ගනු ලැබූ දිනයේ සිට සති හතක් නොඉක්මවන්නා වූ දිනයක් නියම කළ යුතු ය:

එසේ වුව ද, නඩුවට අදාළ අවස්ථාගත කරුණු අනුව, ඇසීමට ඇති නඩුවක් ලෙස ලියාපදිංචි කිරීම ආපසු එවිය යුතු දිනය දීර්ඝ කිරීම අවශ්‍ය බව අධිකරණයේ මතය වේ නම්, අධිකරණය විසින් ඒ දිනය දීර්ඝ කරනු ලැබිය හැකි ය;

(ඇ) නඩුව අදාළ වන ඉඩම මුල් මැනීම සඳහා අධිකරණය විසින් නිශ්චය කරනු ලබන පරිදි ඇස්තමේන්තු කළ ගාස්තුව පැමිණිලිකරු විසින් අධිකරණයේ තැන්පත් කළ යුත්තේ යම් දිනයක හෝ දිනයකට පෙර ද, ඒ දිනය ලෙස, පැමිණිල්ල භාරගත් දින සිට සති හතක් නොඉක්මවන දිනයක් නියම කළ යුතු ය.

ඒ මුල් මැනීමේ ගාස්තු ඇස්තමේන්තු කිරීමේ දී නියෝග මගින් නියම කරනු ලබන යම් ගාස්තු ප්‍රමාණ අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ යෙදෙන "අනුපිටපත්" යන වචනයේ සිට ඒ වගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

"තුන්වන පිටපත, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ නියම කර ඇති ආකාරයට යථා පරිදි පිටපත් කොට, ඒ තුන්වන පිටපත ආපසු එවීම සඳහා අධිකරණය විසින් නියම කර ඇති දිනයේ දී හෝ ඊට පෙර හෝ ආපසු එවිය යුතු අතර, එහි පිටපතක් පැමිණිලිකරුගේ ලේඛනගත නීතිඥවරයාට හෝ එවැනි ලේඛනගත නීතිඥවරයකු නොමැති නම් පැමිණිලිකරුට හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවීමට සැලැස්විය යුතු ය."

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ යෙදෙන "අනුපිටපත" යන වචනය වෙනුවට "තුන්වන පිටපත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) බෙදුම් නඩුවක්, ඇසීමට තිබෙන නඩුවක් ලෙස ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කර ඇති බවට ද, නඩුවට අදාළ ඉඩමේ මුල් මිනුමේ ඇස්තමේන්තු කළ ගාස්තු අධිකරණයේ තැන්පත් කර ඇති බවට ද, නඩුවේ පැමිණිලිකරු 12 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියාකර ඇති බවට ද, අධිකරණය සෑහීමට පත්වන්නේ නම්, 12 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඈ), (ඊ) සහ (උ) ඡේද යටතේ අධිකරණයට ඉදිරිපත් කර ඇති සිතාසි, සිතාසිවල පරිවර්තන, පැමිණිල්ලේ පිටපත් හා පරිවර්තන නැතහොත් අවස්ථාවෝචිත පරිදි, ප්‍රසිද්ධ ප්‍රකාශවල පිටපත් හා පරිවර්තන සහ දැන්වීමේ පිටපත් සහ දැන්වීම් පරිවර්තනවල පිටපත්, විත්තිකරුට සහ පිළිවෙළින් අදාළ වන ග්‍රාම නිලධාරීන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යවන ලෙස සහ, 12 වන වගන්තියේ (2) වන

උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද දැන්වීමේ පිටපත්, ඒවායේ පරිවර්තනවල පිටපත් ද සමඟ, 15 වන වගන්තියේ (3) වන උපවගන්තියේ ඒ සඳහා විධිවිධාන සලසා ඇති පරිදි ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා පිස්කල් වෙත යවන ලෙස අධිකරණය විසින් ආඥා කළ යුතු ය". ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධිකරණය විසින් නියම කරන ලද දිනය, 12 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති සිතාසිවල, සිතාසි පරිවර්තනවල, දැන්වීම් පිටපත්වල සහ දැන්වීම් පරිවර්තන පිටපත්වල අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ අධිකරණයේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ ඇතුළත් කර, ඒවා අත්සන් කර, ලියාපදිංචි තැපෑලෙන් යැවීමට සැලැස්විය යුතු ය." ;

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "ඒ විත්තිකරුට භාර දීම සඳහා නිකුත් කරන ලද සිතාසියට" යන වචන වෙනුවට, "ඒ විත්තිකරුට ලියාපදිංචි තැපෑලෙන් යවන ලද සිතාසියට" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.*

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) "විත්තිකරුවන්ට භාර දීම සඳහා සිතාසි නිකුත් කරන ලෙස අධිකරණය විසින් ආඥාවක් කරනු ලබන" යන වචන වෙනුවට "විත්තිකරුවන්ට සිතාසි භාර දෙන ලෙස ආඥාවක් කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ඉඩම පිහිටා ඇති ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ හෝ එක් එක් ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ ග්‍රාම සේවා නිලධාරි වෙත යැවිය යුතු බවට ද" යන වචන වෙනුවට "ඉඩම පිහිටා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෝ එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු බවට ද" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ග්‍රාම සේවා නිලධාරියකු වෙත යවනු ලැබුවේද" යන වචන වෙනුවට "ග්‍රාම නිලධාරියකු වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබුවේ ද" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "තමා වෙත එවනු ලැබූ" යන වචන වෙනුවට "13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තමා වෙත එවනු ලැබූ" යන වචන ආදේශ කිරීමෙන්.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ "බෙදුම් නඩුවක විත්තිකරුවන් වෙත භාර දීම සඳහා පිස්කල් වෙත සිතාසි නිකුත් කිරීමට අධිකරණය විසින් අණ කරනු ලැබූ විට," යන වචන වෙනුවට, "බෙදුම් නඩුවක විත්තිකරුවන් වෙත සිතාසි භාර දෙන ලෙස අධිකරණය විසින් ආඥාකරනු ලැබූ විට," යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන්:—

"එසේ වුව ද අධිකාර පත්‍ර ලාභියා විසින් කරන ලද ඉල්ලීමක් අනුව සහ වාර්තාගත කළ යුතු හේතු මත අධිකාර පත්‍රයෙහි වාර්තාව එවීමට නියම කර ඇති

දිනය, එක් එක් දීර්ඝ කිරීමේ කාලය දින හැටක් නොඉක්මවන පරිදි, අධිකරණය විසින් වරින් වර දීර්ඝ කරනු ලැබිය හැකි ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයෙහි "සාරානුකූල වූ ද දිවිරුම් පත්‍රයක් මගින් සනාථ කරනු ලැබුවා වූ ද වාර්තාවක්" යන වචන වෙනුවට "සාරානුකූල වූ ද දිවිරුම් පත්‍රයක් මගින් සනාථ කරනු ලැබුවා වූ ද පිටපත් දෙකකින් වූ වාර්තාවක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදයෙහි "මනින ලද ඉඩමේ පිඹුරක්; සහ" යන වචන වෙනුවට "මනින ලද ඉඩමේ පිඹුරක් පිටපත් දෙකකින්; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අලුත් ක්ෂේත්‍ර සටහන් සහ අලුත් පිඹුරක්" යන වචන වෙනුවට "අලුත් ක්ෂේත්‍ර සටහන් සහ අලුත් පිඹුරක්, පිටපත් දෙකකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය අගට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් මෙයින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ:—

"(ඇ) නඩුවේ සෑම විත්තිකරුවකු විසින් ම, නඩුව අවසාන වශයෙන් විනිශ්චය කිරීමට පෙර ඔහු මියගියහොත් එවිට නඩුවේ කාර්ය සඳහා ඔහුගේ නිත්‍යානුකූල නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම පිණිස, 81 වන වගන්තියට අනුකූලව තැනැත්තකු නම් කරන, මේ පනතේ දෙවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූල ලේඛන පත්‍රයක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් ප්‍රකාර යම් තැනැත්තකුට නොබෙදූ බිම් ප්‍රමාණයකට හිමිකම ඇත්තා වූ ද, බිම් ප්‍රමාණයෙහි හෝ වටිනාකමෙහි අල්ප බව හේතුවෙන් හෝ සංවර්ධන කාර්ය සඳහා ඉඩම් බෙදා වෙන් කිරීම විධිමත් කරන යම් ලිඛිත නීතියක නියමිත අවම ප්‍රමාණයට වඩා අඩුවීමේ හේතුවෙන් ඒ තැනැත්තාට බෙදා වෙන් කළ බිම් කට්ටියක් වෙන් කර දීම අවස්ථාවෝචිත නොවන බව අධිකරණය විසින් සලකනු ලබන්නා වූ ද අවස්ථාවක, ඉඩමේ බෙදා වෙන් කළ කොටසක් වෙන් කර දෙන ලෙස ආඥා කිරීම වෙනුවට සහ අධිකරණය විසින් නිශ්චය කරනු ලබන වන්දියක් ඒ තැනැත්තාට ගෙවීම මත ඒ බිම් ප්‍රමාණය, නඩුව අදාළ වන ඉඩමේ නොබෙදූ බිම් ප්‍රමාණයකට හිමිකම ඇති වෙනත් යම් තැනැත්තකුට අධිකරණය විසින් වෙන් කර දෙනු ලැබිය හැකි ය."

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) යම් තැනැත්තකුට අතුරු තීන්දු ප්‍රකාශයක් යටතේ වෙන් කර දෙනු ලබන බෙදා වෙන් කළ බිම් කොටසක් හෝ කොටස්, සංවර්ධන කාර්ය සඳහා ඉඩම් බෙදා වෙන් කිරීම විධිමත් කරන යම් ලිඛිත නීතියක නියමිත අවම ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවක, ප්‍රායෝගිකව කළ හැකි තාක් දුරට, මිනින්දෝරුවරයා විසින් එම බිම් කොටස් තනි කොටසක් ලෙස වෙන් කර දීමට හෝ විකිණීමට හැකිවන ආකාරයට ඒ ඉඩම බෙදා වෙන් කළ යුතු ය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (අ) ඡේදයේ "තමා විසින් පිළියෙල කරන ලද" යන වචන වෙනුවට "තමා විසින් පිටපත් දෙකකින් යුතුව පිළියෙළ කරන ලද" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) පාර්ශ්වකරුවන්ගේ නම් ද, ඒ ඒ පාර්ශ්වකරුවන්ගේ කොටස්වල හා සම්බන්ධතාවල ස්වභාවය හා ප්‍රමාණය ද, ඒ යම් බිම් ප්‍රමාණයක් සංවර්ධන කාර්ය සඳහා ඉඩම් බෙදා වෙන් කිරීම හා සම්බන්ධ යම් ලිඛිත නීතියක නියමිත අවම ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවක, ඒ බවට ප්‍රකාශයක් ද, ඉඩම බෙදා වෙන් කිරීමේ කාර්යය සඳහා ඒ පාර්ශ්වකරුවන්ට දැන්වීම් නිකුත් කළ දිනය හා ඉඩම බෙදා වෙන් කළ දිනය ද සඳහන් කරමින් ඉඩම බෙදා වෙන් කළ ආකාරය පැහැදිළි කෙරෙන්නා වූ ද, එකම ඉඩම් කැබැල්ලක් වෙන් වෙන් පාර්ශ්වකරුවන්ට පොදුවේ වෙන් කර දුන් අවස්ථාවක දී නම් ඒ ඉඩම් කැබෙල්ලේ එක් එක් පාර්ශ්වකරුගේ කොටස නිශ්චිතව සඳහන් කෙරෙන්නා වූ ද පිටපත් දෙකකින් යුත් වාර්තාවක්;" යන ඡේදය ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) එක් එක් කැබෙල්ලේ සහ එහි කරන ලද වැඩි දියුණු කිරීම් කිසිවක් වෙතොත් ඒවා යේ ද ඇගයූ වටිනාකම සහ යම් බිම් කොටස් 26 වන වගන්තිය යටතේ එක් කැබෙල්ලක් ලෙස වෙන් කර දෙන මෙන් අධිකරණය විසින් අධිකාරපත්‍රලාභියාට විධාන කර ඇති අවස්ථාවක, එක් කැබෙල්ලක් ලෙස සැලකෙන බිම් කොටස්වල සහ ඒවායේ කරන ලද වැඩි දියුණු කිරීම් කිසිවක් වෙතොත් ඒවායේ ද ඇගයූ වටිනාකම සහ ඒ වටිනාකම ගණන් බැලූ ආකාරය පිළිබඳ විස්තර; සහ ";

(4) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) බෙදා වෙන් කිරීමේ පිඹුර, සංවර්ධන කාර්ය සඳහා ඉඩම් බෙදා වෙන් කිරීම හා සම්බන්ධ ලිඛිත නීතියට අනුකූල බවට සහතිකයක්; " සහ

(5) "වාර්තාව, ඇගයුම සහ සාරාංශය" යන වචන වෙනුවට "වාර්තාව, අගැයුම, සාරාංශය සහ සහතිකය" යන වචන ආදේශ කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ යෙදෙන "දිනයක් අධිකරණය විසින් නියම කළ යුතුය" යන වචන වෙනුවට, "අධිකරණය විසින් නඩුව විවෘත අධිකරණයේ කැඳවා දිනයක් නියම කළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අවසාන බෙදුම් නඩු තීන්දු ප්‍රකාශය.

36. (1) 35 වන වගන්තිය යටතේ නියම කරන ලද දිනයේ දී හෝ තත් කාර්යය සඳහා අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී, ලසු විභාගයකින් පසුව අධිකරණය විසින්—

(අ) මිනින්දෝරුවරයා විසින් යෝජිත බෙදා වෙන් කිරීමේ ක්‍රමය මඳ වෙනස් කිරීම් සහිතව හෝ රහිතව අනුමත කොට, ඒ අනුව අවසාන බෙදුම් නඩු තීන්දු ප්‍රකාශය වාර්තා ගත කළ හැකි ය;

(ආ) යම් බිම් කැබැල්ලක බිම් ප්‍රමාණය, සංවර්ධන කාර්ය සඳහා ඉඩම් බෙදා වෙන් කිරීම හා සම්බන්ධ ලිඛිත නීතියෙන් නියමිත අවම ප්‍රමාණයට වඩා අඩු බව 32 වන වගන්තිය යටතේ අධිකරණය වෙත අධිකාරපත්‍රලාභියා විසින් වාර්තා කර ඇති අවස්ථාවක, ඒ බිම් කැබැල්ල සඳහා මිනින්දෝරුවරයා විසින් 32 වන වගන්තිය යටතේ දී තිබෙන ඇගයූ වටිනාකමට ඒ බිම් කැබෙල්ල මේ පනතේ විධිවිධාන අනුව විකුණන ලෙස ආඥා කර, ඒ විකිණීමේ ආඥාව හේතු කොටගෙන අවශ්‍ය විය හැකි යම් වෙනස්කිරීම් වලට යටත්ව, අවසාන බෙදුම් නඩු තීන්දු ප්‍රකාශය වාර්තාගත කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියම කරන ලද විකිණීමක් කෙරෙහි 41, 42, 43, 44, 45, 45අ, 46, 47 සහ 48(2) වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 36 අ වගන්තිය වශයෙන් බලපැවැත් විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 36අ වගන්තිය ඇතුළත් කිරීම.

"අභියාචන.

36අ. 36 වන වගන්තිය යටතේ කරන ලද අධිකරණ ආඥාවකින් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින් අභියාචනාධිකරණයේ අවසරය කලින් ලබා ගෙන, ඒ ආඥාවට විරුද්ධව අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් 45අ වගන්තිය ඇතුළත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය, මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 45අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"අභියාචන.

45අ. (1) 45 වන වගන්තිය යටතේ කරන ලද අධිකරණ ආඥාවකින් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින්, කලින් අභියාචනාධිකරණයේ අවසරය ලබාගෙන, ඒ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කළ හැකි ය.

(2) අභියාචනය සඳහා අවසර ලබා ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීම්වලට අදළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ LVIII වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, 36අ සහ 45අ වගන්ති යටතේ කරන ලද ආඥාවලට විරුද්ධව අභියාචනය සඳහා අවසර ලබා ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීම්වලට අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි "ගැනුම්කරුගේ වාසියට නඩු වාර්තාවේ වාර්තාගත කළ යුතු ය " යන වචන වෙනුවට "ගැනුම්කරුගේ වාසියට නඩු වාර්තාවේ වාර්තාගත කර, ඒ සහතිකයේ සහතික කළ පිටපතක් ගැනුම්කරු වෙත නිකුත් කරන ලෙස ආඥා කළ යුතු ය " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (4) වන උපවගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කිරීමෙන්;

(2) "නඩුව සඳහා භාරකරු වශයෙන් පත් කරන ලද" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"නඩුව සඳහා භාරකරුවකු වශයෙන් පත් කරන ලද තැනැත්තකු විසින් 35 වන වගන්තිය යටතේ යෝජිත බෙදා වෙන් කිරීමේ ක්‍රමය සලකා බැලීම සඳහා නියම කරන ලද දිනයේ දී හෝ ඒ දිනයට පෙර හෝ, 42 වන වගන්තිය යටතේ ඉඩම විකිණීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාගේ වාර්තාව අධිකරණය වෙත ලැබීමෙන් දවස් තිහක් ඉකුත්වීමට පෙර යම් අවස්ථාවක දී එවකටත් වාර්තාගත කරන ලද මුල් තීන්දු ප්‍රකාශය කුමක් වුව ද, එකී ඉඩමට හෝ එකී ඉඩම සම්බන්ධයෙන් එම පාර්ශ්වකරුට ඇති අයිතිවාසිකම, හිමිකම හෝ සම්බන්ධතාව ඔප්පු කිරීම සඳහා විශේෂ අවසරයක් පතා අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ, (1) වන උපවගන්තියේ "එකී අලාභ වෙනම නඩුවක් පවරා අයකර ගත හැකි ය" යන වචන වෙනුවට "එකී අලාභ, බෙදුම් නඩුවේ අවසාන තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට අවුරුදු පහකට නොවැඩි කාලයක් ඇතුළත වෙනම නඩුවක් පවරා, අයකර ගත හැකි ය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 52අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු යː—

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 52අ වගන්තිය ඇතුළත් කිරීම.

"සන්තකය පුනස්ථාපනය කිරීම.

52අ. (1) (අ) මේ පනත යටතේ වාර්තාගත කරන ලද යම් අවසාන තීන්දු ප්‍රකාශයක් මගින් යම් ඉඩමකට හිමිකම ඇතැයි ප්‍රකාශයට පත් කරනු ලැබ සිටින්නා වූ, හෝ

(ආ) මේ පනත යටතේ පවත්වන ලද යම් විකිණීමක දී යම් ඉඩමක් මිළදී ගෙන, එසේ මිළදී ගන්නා ලද ඉඩම සම්බන්ධයෙන් විකිණීමේ සහතිකයක් තමාගේ නමට අධිකරණය විසින් වාර්තාගත කරනු ලැබූ, හෝ

(ඇ) (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ සඳහන් කර ඇති තැනැත්තකුගෙන් හිමිකම ලබා ගෙන ඇත්තා වූ,

සහ තමාගේ සන්තකයට අයුතු මැදිහත්වීමක් සිදුවී ඇති හෝ සිදු කරනු ලබන්නා වූ නැතහොත් තමා අසන්තක කරනු ලැබ ඇත්තා වූ තැනැත්තකුට, ඒ අයුතු මැදිහත්වීම හෝ අසන්තක කිරීම අවස්ථාවෝචිත පරිදි අවසාන බෙදුම් නඩු තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට හෝ විකුණුම් සහතිකය වාර්තාගත කරනු ලැබූ දිනයේ සිට අවුරුදු දහයක් ඇතුළත සිදුවී ඇත්නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ අයුතු මැදිහත්වීම හෝ අසන්තක කිරීම සිදුවූ දින සිට මාස දොළහක් ඇතුළත, එම නඩුවේදීම සන්තකය ආපසු ලබා දෙන ලෙස, පෙත්සමක් මගින් ඉල්ලීමක් කිරීමට හිමිකම තිබිය යුතු ය.

(2) සන්තකය ආපසු ලබා ගැනීමේ ඉල්ලීම කරනු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද, ඒ තැනැත්තා ඒ ඉල්ලීමට වගඋත්තරකරු කළ යුතු ය.

(3) අධිකරණය විසින්, ඒ කාරණය පිළිබඳව යථා පරිදි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, ඒ කාරණයේ යුක්තිය අනුව අවශ්‍ය පරිදි සන්තකය භාර දීම සඳහා හෝ අන්‍යාකාර වූ ආඥාවක් කළ යුතු ය:

එසේ වුව ද, වගඋත්තරකරු ආරවුලට විෂය වී ඇති ඉඩමට හෝ එහි කොටස, බෙදා වෙන් කිරීමේ හෝ විකිණීමේ අවසාන බෙදුම් නඩු තීන්දු ප්‍රකාශයෙන් කෙළින් ම හිමිකම ලත් තැනැත්තකු වන අවස්ථාවක, නැතහොත් බෙදා වෙන් කිරීමේ හෝ විකිණීමේ අවසාන බෙදුම් නඩු තීන්දු ප්‍රකාශය යටතේ හිමිකම ලැබූ තැනැත්තකුගෙන් ඒ ඉඩමට හිමිකම අත්කරගෙන ඇති තැනැත්තකු හෝ එකී ඉඩමට හිමිකම් අත්කර ගෙන ඇති තැනැත්තා ට සම්බන්ධ තැනැත්තන්ගෙන් හෝ ඔහුගේ උරුමක්කාරයන්ගෙන් ඒ ඉඩමට හිමිකම අත්කරගෙන ඇති තැනැත්තකු වන අවස්ථාවක ඉඩමේ සන්තකය භාර දීම සඳහා කිසිම ආඥාවක් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්;

(2) එසේ නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියේ—

(අ) "අභියාචනයක් කළ හැකිය" යන වචන වෙනුවට "36අ සහ 45අ වගන්තිවල විධිවිධානවලට යටත්ව අභියාචනයක් කළ හැකිය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) "සිවිල් නඩු විධාන සංග්‍රහයේ සියලු විධිවිධාන ඒ අභියාචනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය " යන වචන වෙනුවට "සිවිල් නඩු විධාන සංග්‍රහයේ සියලු විධිවිධාන, මේ වගන්තියේ මින් ඉදිරියට ඇති විධිවිධානවලට යටත්ව ඒ අභියාචනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන්:—

"(2) යම් බෙදුම් නඩුවකදී යම් අධිකරණයක් විසින් කරන ලද හෝ වාර්තාගත කරන ලද යම් නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, අභියාචනයට විෂය වී ඇති නඩු තීන්දුවේ, තීන්දු ප්‍රකාශයේ හෝ ආඥාවේ අනුපිටපතක් සහ 32 වන වගන්තිය යටතේ අධිකරණය වෙත එවන ලද පිඹුරේ සහ වාර්තාවේ දෙවන පිටපත රඳවා තබා ගෙන, අධිකරණය විසින් අභියාචනය කර ඇත්තේ යම් නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට විරුද්ධව ද, ඒ නඩු තීන්දුවට, තීන්දු ප්‍රකාශයට හෝ ආඥාවට අදාළ සියලු ලිපිලේඛන හා නඩු කටයුතු වාර්තා, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) බෙදුම් නඩුවක දී යම් අධිකරණයක් විසින් කරන ලද හෝ වාර්තාගත කරන ලද යම් නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ අභියාචනය පිළිබඳ තීරණයක් කරනු ලබන තෙක්, ඒ නඩුව පවරා ඇත්තේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද, ඒ ඉඩමට යම් නාස්තියක් හෝ

අලාභ හානියක් සිදු වීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි යම් ආඥා, තත් කාර්යය සඳහා පෙත්සමක් සහ දිවුරුම් පත්‍රයක් මගින් කරනු ලබන ඉල්ලීමක් මත, ඒ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය. එවැනි යම් ආඥාවක් 53 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට බලාත්මක කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "යම් තැනැත්තකු හෝ" යන වචන වෙනුවට "යම් තැනැත්තකු මේ පනතේ දෙවන උපලේඛනයෙන් දක්වා ඇති ආකෘතියට සාරානුකූල දැන්වීමක් ඒ තැනැත්තාට නිකුත් කරන ලදුව, එහි නිශ්චිතව සඳහන් දිනයක හෝ ඊට පෙර පාර්ශ්වකරුවකු වශයෙන් නඩුවට එකතු කරනු ලැබීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට ඉන් නියම කළ පසු ඒ තැනැත්තා විසින් එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ විට;" ;

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කරනු ලැබීමට ඉල්ලුම් කරන යම් තැනැත්තකු විසින් ඔහුගේ ඉල්ලුම්පත්‍රය සමඟ, නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර ඔහු මියගියහොත් බෙදුම් නඩුවේ කාර්ය සඳහා ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විය යුතු තැනැත්තකු 81 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නම් කරමින් මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ලේඛන පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය." ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ඔහු බැඳී සිටිය යුතු ය." යන වචන වෙනුවට "ඔහු බැඳී සිටිය යුතු ය. ගැනුම්කරු විසින්, ආදේශ කරනු ලැබීම සඳහා වූ ඔහුගේ ඉල්ලුම්පත්‍රය සමග, නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර ඔහු මියගියහොත් බෙදුම් නඩුවේ කාර්ය සඳහා ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විය යුතු තැනැත්තකු 81 වන වගන්තියේ විධිවිධානවලට

අනුකූලව නම් කරමින් මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ලේඛන පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් තැනැත්තාට තිබිය යුතු ය" යන වචන වෙනුවට "යම් තැනැත්තාට තිබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ මැදිහත්වන්නකු විසින් මැදිහත්වීම සඳහා වූ ඔහුගේ ඉල්ලුම්පත්‍රය සමග, නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර ඔහු මියගියහොත්, බෙදුම් නඩුවේ කාර්ය සඳහා ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විය යුතු තැනැත්තකු 81 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නම් කරමින් මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ලේඛන පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය." ;

(5) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන්:—

"(4) (1) වන උපවගන්තිය යටතේ පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන යම් තැනැත්තකු, ඔහුගේ හිමිකම් පෑම ඉදිරිපත් කිරීමෙහි ලා අසාධාරණ ප්‍රමාදය පිළිබඳව වරදකරු වී ඇති බව අධිකරණයේ මතය වේ නම් හෝ වෙනත් මනා සහ ප්‍රමාණවත් හේතු නිසා ගාස්තු සඳහා ඇප තැබීමට හෝ කලින් ගාස්තු ගෙවීමට ඒ තැනැත්තාට අධිකරණය විසින් ආඥා කිරීම නීත්‍යානුකූල වන්නේ ය."

(5) මේ වගන්තිය යටතේ නියම කළ යුතු ගාස්තු ප්‍රමාණය තීරණය කිරීමේ දී, ඉල්ලුම්කරුගේ යම් ප්‍රමාදයක්, නඩුව පවතින අවස්ථාව, පාර්ශ්වකරුවන්ට දැරීමට අසාධාරණ ලෙස සිදු කරන ලද යම් වියදමක් සහ අධිකරණය විසින් අදාළ යයි අදහස් කරනු ලබන වෙනත් යම් කාරණයක්, අධිකරණය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(6) ගාස්තු සඳහා ඇප තැබීමට හෝ කලින් ගාස්තු ගෙවීමට නියම කරනු ලැබූ මේ වගන්තියේ සඳහන් යම් තැනැත්තකු අධිකරණය විසින් ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත ඒ ඇපය තැබීම හෝ ගාස්තු කලින් ගෙවීම පැහැර හැරියහොත්, අධිකරණය විසින් ඒ තැනැත්තාගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.";

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්;

(2) ඒ වගන්තිය අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

" (2) බේදුම් නඩුවක කටයුතු කිරීමට අවුරුදු දෙකක් ඇතුළත පියවර ගෙන නොමැති නම්, ඒ නඩුවේ යම් පාර්ශ්වකරුවකු විසින් හෝ ඒ නඩුව පවරා ඇත්තේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද; ඒ ඉඩමට සම්බන්ධතාවක් ඇතැයි කියා සිටින යම් තැනැත්තකු විසින් හෝ ඒ නඩුව නිෂ්ප්‍රභ කිරීම සඳහා මෝසමක් මගින් අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි අතර, නඩුවේ සියලු ම අවස්ථාගත කරුණු අනුව නිෂ්ප්‍රභ කිරීම යුක්තිසහගත යයි අධිකරණය සෑහීමකට පත් වන්නේ නම්, අධිකරණය විසින් නඩුව නිෂ්ප්‍රභ කළ හැකි ය.

(3) අධිකරණය විසින් මේ වගන්තිය යටතේ නඩුවක් නිෂ්ප්‍රභ කරනු ලබන අවස්ථාවක, නඩුව නිෂ්ප්‍රභ කිරීමේ ආඥාවේ පිටපතක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඇසීමට ඇති නඩුවක් ලෙස එය ලියාපදිංචි කළ පත් ඉරුවේ හෝ එහි ඉදිරියට ගෙන ගිය පත් ඉරුවෙහි ලියාපදිංචි කිරීමට අධිකරණය විසින් සැලැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ.:—

"නීත්‍යානුකූල නියෝජිතයා නම් කරන ලේඛන පත්‍රය.

81(1). (මෙහි මින් මතු "නම්කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන)මේ පනත යටතේ බේදුම් නඩුවක සෑම පාර්ශ්වකරුවකුම හෝ ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් යම් තැනැත්තකු හෝ නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර මියගියහොත් නඩුවේ කාර්ය සඳහා ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා වීම සඳහා, යටත් පිරිසෙයින් එක් තැනැත්තකු හෝ තුන්දෙනකුට

නොවැඩි ගණනක් ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව හෝ නම්කරමින් දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ලේඛන පත්‍රයක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

(2) (අ) ඒ නම්කරන්නාගේ මරණයෙන් පසු ඒ නාමිකයන්ගේ ලේඛන පත්‍රයේ නම් දක්වා ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ඒ නාමිකයන්ගෙන් එක් තැනැත්තෙක්, නඩුවේ කාර්ය සඳහා නම් කරන්නාගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(ආ) ලේඛන පත්‍රයේ නම් සඳහන් කර ඇති නාමිකයන් අතුරින් යමෙකු මියගියහොත්, හෝ අබලතාවට පත්වුවහොත්, ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ඊළඟට නම්කර ඇති තැනැත්තා, නම්කරන්නා මියගියහොත් නඩුවේ කාර්ය සඳහා නම්කරන්නාගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(ඇ) එසේ නම් කරනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් එසේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් පත් කරනු ලැබීමට කැමැත්ත පළ කරමින් ලේඛන පත්‍රයට ඔහුගේ හෝ ඔවුන්ගේ අත්සන් තැබිය යුතු ය. නම්කරන්නාගේ ද, එසේ පත් කරනු ලැබීමට කැමැත්ත පළ කරන නාමිකයාගේ හෝ නාමිකයන්ගේ ද අත්සන්වලට නීතිඥවරයකු හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු සාක්ෂි දැරිය යුතු ය:

එසේ වුව ද, එම ලේඛන පත්‍රය ඉදිරිපත් කිරීමට පැහැර හැරීම, එම පැහැර හැරීම නිසාම පමණක් පැමිණිල්ල, හිමිකම් ප්‍රකාශය හෝ පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය දෝෂ සහිත නොවිය යුතු ය; එසේ නැතහොත්, 7 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, ඒ පැමිණිල්ල, හිමිකම් ප්‍රකාශය හෝ පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කිරීම සඳහා වූ යම් ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතුවක් හෝ පදනමක් නොවිය යුතු ය.

(3) නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර, යම් වේලාවක අධිකරණය විසින් සිය මෙහෙයීමෙන්ම හෝ යම් පාර්ශ්වයක ඉල්ලීම පිට, මේ පනතේ විධිවිධාන යටතේ නඩුවේ පාර්ශ්වකරුවකුට හෝ ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීමට නියමිත යම් තැනැත්තකුට ඒ ලේඛන පත්‍රය අධිකරණය විසින් තත්කාර්ය ය සඳහා නියම කරනු ලබන දිනයක හෝ එදිනට පෙර ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකි ය.

(4) නාමිකයකු විසින්, නම්කරන්නාගේ මරණයට පෙර යම් වේලාවක, නම්කරන්නාට දැන්වීමක් සහිතව, මෝසමක් මගින්, එම නාමිකයා වීමට තමාගේ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට අධිකරණයට ඉල්ලුම් කළ හැකි අතර, එවැනි අවස්ථාවක දී ඔහු නම් කරන්නාගේ නාමිකයාව සිටීම නතර වන බවට අධිකරණය විසින් ආඥාවක් කළ යුතු ය. තව ද අධිකරණය විසින් නම්කරන්නා විසින් ඉදිරිපත් කළ ලේඛන පත්‍රයෙන් එම නාමිකයාගේ නම කපා හැරීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, නම් කරන්නකු විසින්, නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර යම් අවස්ථාවක, නාමිකයන්ට දැන්වීම් ඇතිව, නාමිකයන් එක්කෙනකු හෝ වැඩි ගණනක් නම්කරමින් අලුත් ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීමට ඉල්ලුම් කළ හැකි ය. එම අලුත් ලේඛන පත්‍රය ඉදිරිපත් කළ විට, එම නම්කරන්නාගේ කලින් වූ ලේඛන පත්‍රය ප්‍රත්‍යාදිෂ්ට විය යුතු අතර, එම අලුත් ලේඛන පත්‍රයේ අඩංගු නම්කිරීම නොපමාව බලාත්මක විය යුතු ය.

(6) නම්කරන්නකු මිය ගිය විට, නම්කරන්නා විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පත්‍රයේ ප්‍රමුඛත්ව අනුපිළිවෙළ අනුව පළමුවෙන් නම්කරනු ලැබ ඇති තැනැත්තා නඩුවේ කාර්ය සඳහා, නම් කරන්නා මියගිය වේලාවේ සිට ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(7) මියගිය නම්කරන්නකුගේ නීත්‍යනුකූල නියෝජිතයා වශයෙන් සලකනු ලබන නාමිකයකු, මියගිය නම් කරන්නා ජීවත්ව සිටියේ නම් නඩුවේ කාර්ය සඳහා ඔහු විසින් ගත හැකිව තිබුණු සියලු පියවර ගැනීමට හිමිකම ලැබිය යුතු ය.

(8) (අ) නාමිකයකු විසින් මියගිය නම්කරන්නකුගේ නීත්‍යනුකූල නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය. එසේ වුව ද, ඔහු විසින්

අධිකරණයේ අවසරය කලින් ලබාගෙන, එම නම්කරන්නාගේ වෙනත් නාමිකයන් සිටිනම් ඔවුන්ට දැන්වීම් සහිතව, පෙත්සමක් මගින් එම නම් කරන්නාගේ නීත්‍යානුකූල නියෝජිත ධුරයෙන් නිදහස්වීමේ අවසරය සඳහා අධිකරණයෙන් ඉල්ලුම් කළ හැකි ය.

(ආ) අධිකරණය විසින් එම අවසරය දුනහොත්, නම් කරන්නා විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පත්‍රයේ ප්‍රමුඛත්ව අනුපිළිවෙළ අනුව ඊළඟට සිටින නාමිකයා නඩුවේ කාර්ය සඳහා ඒ මියගිය නම්කරන්නාගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් සැලකිය යුතු ය.

(ඇ) මියගිය නම්කරන්නකුගේ එකම නාමිකයා විසින් හෝ ඉතිරිව සිටින එකම නාමිකයා විසින් මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, ඒ නාමිකයා විසින් ඔහුගේ ඉල්ලුම්පත්‍රය පිළිබඳව ඒ මියගිය නම්කරන්නාගේ උරුමක්කාරයන්ට දැන්විය යුතු අතර, ඉහත කී පරිදි අධිකරණය විසින් අවසර දුනහොත්, ඒ අධිකරණය විසින් ඒ මියගිය නම්කරන්නාගේ කැමතිවන උරුමකරුවකු නඩුවේ කාර්ය සඳහා ඒ මියගිය නම්කරන්නාගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කළ යුතු ය.

(9) පාර්ශ්වකරුවකු හෝ තැනැත්තකු විසින් මේ වගන්තියේ විධිවිධාන යටතේ ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීම පැහැර හැර ඇති වුව ද, එමෙන්ම ඒ මියගිය පාර්ශ්වකරුගේ හෝ තැනැත්තාගේ බුද්ලය නියෝජනය කිරීමට නීත්‍යානුකූල නියෝජිතයකු පත් කර නොමැති වුවද, නඩුවේ දී සටහන් කරන ලද යම් නඩු තීන්දුවක් හෝ තීන්දු ප්‍රකාශයක් හෝ නඩුවේ දී කරන ලද යම් ආඥාවක්, බෙදා වෙන්කිරීමක් හෝ විකිණීමක් හෝ දෙයක්, වලංගු සහ බලාත්මක ලෙස ද, මේ පනතේ විධිවිධානවලට අනුකූල ලෙස ද, සලකනු ලැබිය යුතු අතර, එයින් ඒ මියගිය පාර්ශ්වකරුගේ හෝ තැනැත්තාගේ නීත්‍යානුකූල උරුමක්කාරයන් හා නියෝජිතයන් බැඳී සිටිය යුතු ය. ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීම පිළිබඳ එවැනි පැහැර හැරීමක් ඒ නඩුවේ කටයුතු අවලංගු කිරීමෙහි ලා හේතුවක් ද නොවිය යුතු ය.

(10) (අ) මේ වගන්තියෙන් නියමිත පරිදි ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීම පැහැර හැර ඇති පාර්ශ්වකරුවකු හෝ තැනැත්තකු මියගිය විට, ඒ මියගිය පාර්ශ්වකරුගේ හෝ තැනැත්තාගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් තැනැත්තකු පත් කරන ලෙස ඉල්ලා සිටිමින් යම් පාර්ශ්වකරුවකු හෝ තැනැත්තකු විසින් ඒක පාර්ශ්වික ඉල්ලුම් පත්‍රයක් මගින් අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි අතර, අධිකරණය විසින් පරීක්ෂණයකින් පසුව එම පත්වීම අවශ්‍ය බවට සෑහීමට පත්වූ විට, නඩුවේ කාර්ය සඳහා එම මියගිය පාර්ශ්වකරුගේ හෝ තැනැත්තාගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් සුදුසු තැනැත්තකු පත් කළ හැකි ය. ඒ නීත්‍යානුකූල නියෝජිතයා ඒ පත්වීමේ අවස්ථාව තෙක් පැවති නඩුකටයුතු වලින් බැඳී සිටිය යුතු ය.

(ආ) එකී ඉල්ලුම්පත්‍රය සහ පත්කිරීම, නඩු විභාගය හෝ නඩු කටයුතු කල්දැමීම සඳහා හේතුවක් නොවිය යුතු යෘ

එසේ වුව ද, නඩු විභාගය කල් තැබීම සඳහා ඉඩදීම යුක්තිය ඉටුවීම සඳහා හිතකර වේ යැයි අධිකරණය අදහස් කරතොත්, අධිකරණය විසින් හේතු වාර්තාගත කිරීමෙන් පසුව සහ කලින් ගාස්තු ගෙවීම මත අධිකරණයේ අභිමතය පරිදි නඩුවේ කල් තැබීමකට ඉඩදිය හැකි ය.

(ඇ) කලින් නඩු ගාස්තු ගෙවීමට නියම කිරීමේ දී අධිකරණය විසින් නඩුව පැවරූ දිනය, සහ එම ඉල්ලුම් පත්‍රයට කලින් නඩුව පැවැත්වූ දිනයන් ද, නඩුවේ අවස්ථාව ද, අදාළ යයි අධිකරණය අදහස් කරන වෙනත් කාරණා ද අධිරණය විසින් සැලකිල්ලට ගත යුතු ය.

(11) (අ) මියගිය නම්කරන්නකුගේ උරුමක්කාරයකු විසින්, ඒ නම්කරන්නාගේ මරණයෙන් පසු යම් අවස්ථාවක, ඒ මියගිය නම්කරන්නාගේ නීත්‍යානුකූල නියෝජිතයා ඉවත් කර, ඉල්ලුම් පත්‍රයේ නම්කර ඇති වෙනත් තැනැත්තකු හෝ මියගිය නම් කරන්නා විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පත්‍රයේ ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ඊළඟට නම් කර ඇති තැනැත්තා හෝ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් පත් කිරීම සඳහා ඉල්ලුම් කළ හැකි ය. මියගිය නම්කරන්නාගේ තත්කාලයේ නීත්‍යානුකූල නියෝජිතයා වන තැනැත්තා ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් වගඋත්තරකරුවකු කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ නීත්‍යනුකූල නියෝජිතයා ඉවත් කර, මියගිය නම් කරන්නා විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පත්‍රයේ ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ඊළඟට නම්කර ඇති තැනැත්තා හෝ ප්‍රමාණවත් හේතු ඇත්නම් ඉල්ලුම් පත්‍රයේ නම්කර ඇති තැනැත්තා හෝ මියගිය නම්කරන්නාගේ නීත්‍යනුකූල නියෝජිතයා වශයෙන් පත් කිරීම මියගිය නම්කරන්නාගේ උරුමක්කාරයන්ගේ යහපත සඳහා වන්නේ යයි අධිකරණය සෑහීමට පත් වූ විට අධිකරණය විසින් එසේ පත් කළ හැකි ය.

(ඇ) මේ වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රයක්, පෙත්සමක් සහ දිවුරුම් පත්‍රයක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, අධිකරණය විසින් එහි අභිමතය පරිදි, මියගිය නම් කරන්නාගේ වෙනත් උරුමක්කාරයන් ඇත්නම් ඔවුන්ට ඉල්ලුම් පත්‍රය පිළිබඳ දැන්වීම් නිකුත් කළ හැකි ය.

(12) මේ පනත යටතේ ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීමට නියමිත පාර්ශ්වකරුවකුගේ හෝ තැනැත්තකුගේ හෝ මරණය හේතුකොටගෙන මේ පනත යටතේ වූ කිසිම නඩු කටයුත්තක් කල් තැබීම හෝ අඩාලව කල් තැබීම හෝ නඩුවේ යම් පියවරක් කල් තැබීම හෝ නොකළ යුතු ය.

(13) (4), (5), (8) (අ), (10) හෝ (11) වන උපවගන්ති යටතේ වූ ඉල්ලුම් පත්‍රයක් නඩු විභාගය කල් තැබීමට හේතුවක් නොවිය යුතු ය. එසේ වුව ද, එවැනි යම් කල් තැබීමට ඉඩදීම යුක්තිය ඉටුවීම සඳහා හිතකර වේ යැයි අධිකරණය අදහස් කරන්නේ නම් ඉල්ලීම ඉදිරිපත් කරන තැනැත්තා විසින් ගාස්තු ගෙවනු ලැබූ විට, එවැනි කල් තැබීමකට අධිකරණය විසින් ඉඩදිය හැකි ය.

(14) මේ වගන්තියේ කාර්ය සඳහා "නීත්‍යනුකූල නියෝජිතයා" යන්නෙන් මේ වගන්තිය යටතේ නම් කිරීමක් හෝ අධිකරණය විසින් පත් කිරීමක් අනුව නඩුවේ කාර්ය සඳහා මියගිය පාර්ශ්වකරුවකුගේ හෝ තැනැත්තකුගේ බුද්ගලය නියෝජනය කරන තැනැත්තෙක් අදහස් වේ."

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) 12(2) වන වගන්තිය යටතේ නියමිත "සිතාසියේ ආකෘතිය" යන ශීර්ෂයෙන් යුත් ආකෘතියේ "ඔබට නියම කරනු ලැබේ" යන වචන වෙනුවට "ඔබට නියම කරනු ලැබේ. තවද (ඔබ හිමිකම් ප්‍රකාශයක් ඉදිරිපත් කළත් නැතත්) නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර ඔබ මියගියහොත් නඩුවේ කාර්ය සඳහා ඔබේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් බෙදුම් නඩු පනතේ 81 වන වගන්තියට අනුකූලව තැනැත්තකු නම් කරමින් එම පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ලේඛන පත්‍රයක් එම දිනයේ හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට ද ඔබට මෙයින් නියම කරනු ලැබේ." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) 12(2) වන වගන්තිය යටතේ නියමිත "දැන්වීම පිළිබඳ ආකෘතිය" යන ශීර්ෂය යටතේ ඇති ආකෘතියේ "මෙයින් නියම කරනු ලැබේ". යන වචන වෙනුවට "මෙයින් නියම කරනු ලැබේ. තවද (ඔබ හිමිකම් ප්‍රකාශයක් ඉදිරිපත් කළත් නැතත්) නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර ඔබ මියගියහොත් නඩුවේ කාර්ය සඳහා ඔබේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් බෙදුම් නඩු පනතේ 81 වන වගන්තියට අනුකූලව තැනැත්තකු නම්කරමින් එම පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ලේඛන පත්‍රයක් එම දිනයේ දී හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට ද ඔබට මෙයින් නියම කරනු ලැබේ." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) 12(2) වන වගන්තිය යටතේ නියමිත "පිස්කල් වෙත යවනු ලබන අණ පත්‍රයේ ආකෘතිය" යන ශීර්ෂයෙන් යුත් ආකෘතියේ "මේ සමග එවා ඇති" යන වචනවල සිට "මේ අධිකරණය වෙත සහතික කරන්න" යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවට "මේ සමග එවා ඇති දැන්වීම නොපමාව ම ප්‍රදර්ශනය කර සහ එහි අඩංගු දේ බෙදුම් නඩු පනතේ 15 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රකාශයට පත් කිරීමට සලස්වා, මේ අණපත්‍රය ඔබ විසින් ක්‍රියාවේ යොදවනු ලැබුවේ කවර ආකාරයකින් ද යන වග 19 මස වන දින හෝ එදිනට පෙර

මේ අධිකරණය වෙත සහතික කරන්න." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) 16 වන වගන්තිය යටතේ නියමිත "මුල් මැනීම සඳහා අධිකාර පත්‍රය" යන ශීර්ෂයෙන් යුත් ආකෘති පත්‍රයේ "19 මස වන දින හෝ එදිනට පෙර" යන වචනවල සිට "තැන්පත් කර ඇත" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට "එය පිටපත් දෙකකින් යුක්තව ද නියමිත ආකෘතියට සාරානුකූල වූ ඔබේ වාර්තාවේ පිටපත් දෙකක් ද, ඔබේ ක්ෂේත්‍ර සටහන්වල සත්‍ය පිටපතක් ද 19 මස වන දින හෝ ඊට පෙර මේ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස ඔබට මෙයින් අණ කරනු ලැබේ.

මැනීම කරන අවස්ථාවේ දී ඉඩම සම්බන්ධයෙන් යම්කිසි හිමිකම්පෑමක් ඉදිරිපත් කර සිටින (නඩුවේ පාර්ශ්වකරුවකු නොවූ) යම් තැනැත්තකුට හෝ ඔහුගේ නියෝජිතයාට 16 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දැන්වීමේ පිටපතක් භාර දෙන ලෙස ඔබට වැඩිදුරටත් නියම කරනු ලැබේ.

ඔබේ ගාස්තු වශයෙන් රු. ක මුදලක් මේ අධිකරණයෙහි තැන්පත් කර ඇත.

**සැලකිය යුතුයි:** මෙහි නියම කර ඇති දිනවල දීර්ඝ කිරීම්, එම දීර්ඝ කිරීම අවශ්‍ය වීමට හේතු සඳහන් කරමින් ඔබ විසින් කරනු ලබන ඉල්ලීමක් මත පමණක් දෙනු ලැබේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) 20 වන වගන්තිය යටතේ නියම කරන ලද "දැන්වීම් ආකෘතිය" යන ශීර්ෂයෙන් යුත් ආකෘතියේ "ඔබට මෙයින් නියම කරනු ලැබේ" යන වචන වෙනුවට—

"ඔබට මෙයින් නියම කරනු ලැබේ.

තවද (ඔබ හිමිකම් ප්‍රකාශයක් ඉදිරිපත් කළත් නැතත්), නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර ඔබ මියගියහොත් නඩුවේ කාර්ය සඳහා ඔබේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් බෙදුම් නඩු පනතේ 81 වන වගන්තියට අනුකූලව තැනැත්තකු නම්කරමින් එම

පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ලේඛන පත්‍රයක් එම දිනයේ දී හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට ද ඔබට මෙයින් නියම කරනු ලැබේ." යන වචන හා ඉලක්කම් අදේශ කිරීමෙන්.

(6) 32 වන වගන්තිය යටතේ නියමිත "අධිකාර පත්‍ර ලාභී විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාව" යන ශීර්ෂය යටතේ වූ ආකෘතියේ,

(අ) එහි (vi) වන ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

" (vi) බෙදා වෙන් කිරීම කළ ආකාරය, පාර්ශ්වකරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ඒ කොටස්වල සහ සම්බන්ධතාවල ස්වභාවය සහ ප්‍රමාණය (ඉඩම බෙදා වෙන් කරනු ලැබුවේ යම් කැබලි ගණනකට ද, ඒ ගණන ද, එක් කැබැල්ලක් වශයෙන් එකට වෙන්කර දී ඇති කැබැලි කිසිවක් වේ නම් ඒ කැබලි ගණන ද මෙහි සඳහන් කළ යුතු අතර, අංකය සහ දිනය සහිතව බෙදා වෙන් කිරීමේ පිඹුරට ද, ඇගයුම පිළිබඳ උපලේඛනවලට ද බෙදා දීම පිළිබඳ සාරාංශයට ද මෙහි සඳහනක් කළ යුතු අතර, සංවර්ධන කාර්ය සඳහා ඉඩම් අතුරු බෙදීමට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල නොවන යම් ඉඩම් කැබලි ඇද්ද යන වග සඳහන් කරන්න)";

(ආ) එහි (vii) වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(viii) එක් කැබැල්ලක් වශයෙන් සලකනු ලබන යම් කැබලිවල ඇගයු වටිනාකම "; සහ

(ඇ) එහි 5 වන විෂයට පසුව, පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:—

"6. එකී පිඹුර, සංවර්ධන කාර්ය සඳහා ඉඩම් අතුරු බෙදීමට අදාළ ලිඛිත නීතියට අනුකූල බව මම සහතික කරමි.".

සැ. යු. මේ සහතිකයට යම් ව්‍යතිරේක ඇත්නම්, උදාහරණයක්

වශයෙන්, පිඹුරේ දැක්වෙන යම් ඉඩම් කැබැල්ලක්, සංවර්ධන කාර්ය සඳහා ඉඩම් අතුරු බෙදීමට අදාළ යම් ලිඛිත නීතියකට අනුකූල නොවේ නම්, එහි විස්තර, සහතිකයට ව්‍යතිරේකයක් වශයෙන් දැක්විය යුතු ය.

(7) එම උපලේඛනයේ අවසානයට පහත දැක්වෙන අලුත් ආකෘති එකතු කිරීමෙන්:—

"69(1)(අ) වගන්තිය යටතේ දැන්වීමේ ආකෘතිය
[69(1)(අ) වගන්තිය]

......................දිසා අධිකරණයේදී ය.

නඩු අංකය————

ඒ. බී............පැමිණිලිකරු

-එදිරිව-

සී. ඩී...........
සහ වෙනත් අය. විත්තිකරුවෝ

......................දිස්ත්‍රික්කයේ.................ගමේ/ගම්වල පිහිටි..............නැමති ඉඩම/ඉඩම් බෙදා වෙන් කිරීම/විකිණීම සඳහා බෙදුම් නඩු පනත යටතේ ............දිසා අධිකරණයේ අංක......දරන නඩුව පවරා ඇති බව ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඔබ නඩුවේ පාර්ශ්වකරුවකු විය යුතු බව හෝ පාර්ශ්වකරුවකු කළ යුතුව තිබූ බව අධිකරණයේ මතය වෙයි.

මේ ඉඩමේ/ඉඩම්වල යම් සම්බන්ධතාවකට ඔබ හිමිකම්පාන්නේ නම්, ඉහත සඳහන් නඩුවට පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කරනු ලැබීමට 19.........මස.........වන දින හෝ ඊට පෙර ලියවිල්ලකින් වූ මෝසමක් මගින් ඉල්ලුම් කිරීමට ඔබට මෙයින් නියම කරනු ලැබේ. තව ද හිමිකමක් ඇත්නම්, ඔබේ හිමිකම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ද, 19 වන වගන්තියේ නියමයන්ට අනුකූල වන ලෙස ද ඔබට මෙයින් නියම කරනු ලැබේ. තවද (ඔබ හිමිකම් ප්‍රකාශයක් ඉදිරිපත් කළත් නැතත්, නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර ඔබ මියගියහොත් නඩුවේ කාර්ය සඳහා ඔබේ නීත්‍යානුකූල

නියෝජිතයා වශයෙන් බෙදුම් නඩු පනතේ 81 වන වගන්තියට අනුකූලව තැනැත්තකු නම් කරමින් එම පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ලේඛන පත්‍රයක් එම දිනයේ හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට ද ඔබට මෙයින් නියම කරනු ලැබේ.

අධිකරණය විසින් ඔබ ඉහත කී නඩුවට පාර්ශ්වකරුවකු වශයෙන් එකතු කරනු ලැබුවහොත්, ඔබේ යම් හිමිකම් ප්‍රකාශයක් ඇත්නම් එය ඉදිරිපත් කළ යුතු වන්නේ යම් දිනයක හෝ ඊට පෙර ද එම දිනය වශයෙන් අධිකරණය විසින් නියම කළ දිනය පිළිබඳව දැනගතයුතු බවද 19 වන වගන්තියේ නියමයන් අනුව කටයුතු කළ යුතු බවද ඔබට මෙයින් නියම කරනු ලැබේ.

අත්සන් කළේ...............
රෙජිස්ට්‍රාර්.

19.......මස.......වන දින දිය.

නීත්‍යානුකූල නියෝජිතයා නම් කිරීමේ ලේඛන පත්‍රයේ ආකෘතිය

(81 වන වගන්තිය)

............දිසා අධිකරණයේදී ය.

නඩු අංකය:

පැමිණිලිකරු

-එදිරිව-

විත්තිකරු සහ වෙනත් අය.

(පැමිණිලිකරු/විත්තිකරු/මිනින්දෝරුවරයා ඉදිරියේ හිමිකම් පාන්නා/අනාවරණ කළ පාර්ශ්වකරු/අධිකරණය විසින් එකතු කළ පාර්ශ්වකරු/එකතු කිරීමට/ආදේශිත කිරීමට අපේක්ෂා කරන පාර්ශ්වකරු).......................වන මම මෙයින් මේ නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර මා මියගියහොත් මේ නඩුවේ කාර්ය සඳහා මගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන්

ප්‍රමුඛතා අංක 1.......................

2.......................

3.......................

ඉහත දක්වා ඇති ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව පත් කරමි. තවද ඉහත කී පරිදි මා මියගියහොත්, තවුවේ කාර්ය සඳහා මගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් ඉහත දක්වා ඇති ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ඔවුන් පත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

1.........................පදිංචි .........................................

..............................වන මම ඉහත සඳහන් පත්වීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

..............................

අත්සන

මේ ලේඛන පත්‍රයේ ඇතුළත් කරුණු කියවා තේරුම් ගන්නා ලද මා විසින් මේ ලේඛන පත්‍රයේ ඇතුළත් කරුණු කියවා තේරුම් කර දෙනු ලැබූ ඉහත නම සඳහන් තැනැත්තා විසින් මේ ලේඛන පත්‍රය වර්ෂ 19......,වූ......මස...........වන දින වූ මෙදින.........................දී ඔහුගේ අත්සන මා ඉදිරිපිට දී තබන ලද තැබූ බව............ නීතිඥ/සමාදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්....................................වන මම සහතික කරමි.

..............................

අත්සන

නීතිඥ/සමාදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.

2..............................පදිංචි...................................වන මම ඉහත සඳහන් පත්වීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

..............................

අත්සන

මේ ලේඛන පත්‍රයේ ඇතුළත් කරුණු කියවා තේරුම් ගන්නා ලද, මා විසින් මේ ලේඛන පත්‍රයේ අතුළත් කරුණු කියවා තේරුම් කර දෙනු ලැබූ ඉහත නම සඳහන් තැනත්තා/තැනැත්තිය විසින්

19............මස............වන දින වන මෙදින ...............දී ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ මෙහි තැබූ බව නීතිඥ/සමාදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.........................හි .................වන මම සහතික කරමි.

..............................
අත්සන
නීතිඥ/සාමදන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.

3.............................හි..............................වන මම ඉහත සඳහන් පත්වීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

..........................
අත්සන

මේ ලේඛන පත්‍රයේ ඇතුළත් කරුණු කියවා තේරුම් ගෙන මවිසින් මේ ලේඛන පත්‍රයේ ඇතුළත් කරුනු කියවා තේරුම් කර දෙනු ලැබූ ඉහත නම් සඳහන් තැනැත්තා/තැනැත්තිය විසින් 19............මස............වන දින වන මෙදින ...............දී ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරිපිට දී තැබූ බව නීතිඥ/සමාදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.........................හි .................වන මම සහතික කරමි.

..........................
අත්සන
නීතිඥ/සාමදන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.
අත්සන..................................

(පැමිණිලිකරු/විත්තිකරු/පාර්ශ්වකරු/හිමිකම් පාන්නා/අවශ්‍ය පාර්ශ්වකරු/එකතු කළ/ආදේශ කළ පාර්ශ්වකරු)

මේ ලේඛන පත්‍රයේ ඇතුළත් කරුණු කියවා තේරුම් ගෙන මවිසින් මේ ලේඛන පත්‍රයේ ඇතුළත් කරුනු කියවා තේරුම් කර දෙනු ලැබූ ඉහත නම් සඳහන් තැනැත්තා/තැනැත්තිය විසින් 19............මස............වන දින වන මෙදින ...............දී ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරිපට දී තැබූ බව නීතිඥ/සමාදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.......................හි... ...............වන මම සහතික කරමි.

..............................
අත්සන
නීතිඥ/සාමදන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්.

**29**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී යම් අධිකරණයක පවරනු ලැබ විනිශ්චයට භාජනයව පවත්නා සෑම බෙදුම් නඩුවක්, ඉල්ලුම්පත්‍රයක් හෝ වෙනත් කාරණයක් ම, අවස්ථාගත කරුණු අනුව ඉඩ ලැබෙන තාක් දුරට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව මුලින් පැවරුවාක් මෙන් ද, ඒ ආකාරයෙන් ද, සෑම අතින් ම එය එසේ පවරනු ලැබ ඇති පරිදි ද, මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ (නඩුවේ පාර්ශ්වකරුවන් සහ වෙනත් තැනැත්තන් විසින්, නීත්‍යනුකූල නියෝජිතයන් නම් කරමින් ලේඛන පත්‍රයක් ඉදිරිපත් කිරීමට නියම කෙරෙන විධිවිධාන ඇතුළුව) විධිවිධාන යටතේ දිගට ම පවත්වා ගෙන ගොස් අවසාන නඩු තීන්දුව සහ තීන්දු ප්‍රකාශය තෙක් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය. අන්තර්කාලීන විධිවිධාන.

**30**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.